# ජීවන මඟ.

# The Way of Life.

මා දෙවියන්වහන්සේගේ දරුවෙකැයි දැන ගත්තේ කෙසේද? මා සැබවින්ම ගැළවීම ලබා ඇතැයි මම දැන ගන්නේ කෙසේද? පල්ලියක සාමාජිකයෙකු වූ පමණින් ඔබට ගැලවීමක් නොලැබේ. කෙතරම් ආගමික කටයුතුවල යෙදුනත් ඔබට ගැලවීමක් නැත. හොඳ කෙනෙකු වූ නිසාම ගැලවීමට නොහැකිවේ. එසේ නම් ඔබ කෙසේ ගැලවීම ලබත්ද? ඒ සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම කුමක්ද? ඔබට ගැලවීමක් ලැබිය හැකි එක් මඟක් පමණක් ඇත. යේසුස් වහන්සේ විසින් නියම කර ඇති පරිදි "ඔබ නැවත ඉපදිය යුතුය."

යහපත්, අවංක, ආගමික මිනිසුන් බොහෝ දෙනෙකුට සදාකාලික ජීවනය අහිමි වී ඇත. ඒ මන්ද යත්, ගැලවීම පිළිබඳ දෙවියන් වහන්සේගේ සරල සැලැස්මට අකීකරු වූ නිසාය. නැතහොත් ඒ ගැන නොදැන සිටින නිසාය. ඒ නව සැලැස්ම නම් අළුත් උත්පත්තිය පිළිබඳ අත්දැකීමයි.

යේසුස් වහන්සේගේ ගෝලයෙක් වන පේත්‍රුස්ට ස්වර්ගයේ යතුර නුඹට දෙන්නෙමි.
...... **(ශු මතෙව් 16:19)**

යේසුස් වහන්සේ ස්වර්ගස්ථවීමට මොහොතකට පෙර මෙසේ අණ කළ සේක. "යෙරුසලම නගරයේ රැඳී සිටින්න. ඉහලින් බලය ලැබෙන තුරු එහි රැදෙන්න." ක්‍රියා පොතේ දැක්වෙන අන්දමට පේත්‍රුස් සහ අනෙකුත් ශ්‍රාවකයෝ යාඥාව සඳහා රැස්ව යේසුස්වහන්සේ අණ කල පරිදි බලා සිටියහ. ඒ පියාණන් වහන්සේගේ ප්‍රතිඥාව ලැබෙන තෙක්ය. පෙන්තකොස්ත දිනයේදී යුදෙව් මංගල්‍ය දිනයකදී දෙවියන්වහන්සේ සිය ප්‍රතිඥාව එවූ සේක. ශුද්ධාත්මයාණන් ගෙන් පරිපූර්ණ වූ ඔවුන් සැම දෙනාම වෙනත් භාෂා වලින් කථා කරන්නට වූහ. පේත්‍රුස් මේ අවස්ථාවේ දේශනාවක් කළේය. එයින් අළුත් යුගයක ආරම්භය ඇතිවිය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිපත්වීම මිහිදන් කිරීම හා උත්ථානය ගැන දේශනා කරනු අසා සිටි බොහෝ මිනිස්සු තමන්ගේ වරදකාරත්වය තේරුම් ගනු ලැබූහ. "දැන් කුමක් කරමු දැයි" ඔවුහු හඩ නගා ප්‍රශ්න කළහ. **ක්‍රියා 2:37**

පේත්‍රුස් ඔවුන්ට කියූ වචන තේරුම් ගැනීමට උත්සාහ කරමු. ස්වර්ග රාජ්‍යයට ඇතුළු වන යතුර ඇත්තේ ඒ වචන වලය. මිනිසාට නැවත උත්පත්තිය ලැබිය හැක්කේ කෙසේ දැයි ඒ වචන වලින් ඉගැන්වේ.

නුඹලා සියල්ලෝම, පසුතැවිලිව පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බෞතිස්මය ලබා පල්ලා. එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්හුය.
....... **ක්‍රියා 2:38.**

## පළමු පියවර : පසුතැවිලි වන්න.

## Step One (REPENT)

ඔබේ පළමු පියවර විය යුත්තේ සැබෑ පසුතැවිල්ල ඔස්සේ දෙවියන් වහන්සේ දෙසට හැරීමය. නිර්ව්‍යාජ පශ්චාත්තාපය හෙවත් සැබෑ පසුතැවිල්ල යනු ඔබේ පවු වෙනුවෙන් කෙරෙන දිව්‍යමය කන්නලව්වකි. පව් පිළිබඳව පාපොච්චාරණය කරමින්, පව් සමාව ඉල්ලා දෙවියන්වහන්සේගෙන් සමාව අයැද සිටි විට කරුණාබර සර්ව සාධාරණ දෙවියන් වහන්සේ ඔබට පව් සමාව දී ඔබ පිරිසිදු කරන සේක. පශ්චාත්තාප වන ඔබ ඒ මගින් ආපස්සට හැරී ඔබගේ ජීවිතය නිවැරදි මගට යොමු කරගන්නවා ඇත. ක්‍රිස්තුස්වහන්සේ කුරුසය මත තබා මරණයට පත් කළාක් මෙන් ඔබගේ පැරණි ජීවිතය කුරුසපත් කිරීම එයින් සිදු වේ. ...... පසුතැවිලි නුනොත් නුඹලා සියල්ලෝම එසේම විනාශ වන්නෝය. **(ලූක් 13:3)**

## දෙවන පියවර බෞතිස්ම ලබන්න.

## Step to Baptized.

යම් තැනැත්තෙකු අවංකවම පසුතැවිල්ලට පත්ව පැරණි ජීවිතයෙන් මියගියවිට, ඔහු බෞතිස්ම කරනු ලැබීමට සූදානම්ය. බෞතිස්මය යනු ක්‍රිස්තුස්වහන්සේගේ භූමදාන ක්‍රමයකි. ඔබ බෞතිස්ම

ලබන ආකාරය අතිශයින්ම වැදගත්ය. බෞතිස්මය ගුමදාන ක්‍රමයක් බැවින් ජලයෙන් මුළුමණින්ම වැසීයන සේ සම්පූර්ණයෙන්ම දියේ ගිලිය යුතුය. බයිබලයේ දැක්වෙන පැහැදිලි ඉගැන්වීම මෙයයි. පසුතැවිලි වීමත් පව්සමාව ලැබීමත් තමන්වහන්සේගේ නමින්ම දේශනාකළ යුතු යයි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් පැහැදිලිවම උපදෙස් දී ඇත. **(ලූක් 24:47)**

අපෝස්තළුවරු අපගේ දෙවියන්වහන්සේගේ උපදෙස් ඒ ආකාරයටම පිලිපැද්දාහ. බෞතිස්ම අවස්ථාවේදි හැමවිටම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් යනුවෙන් ප්‍රකාශ කර ඇති බව පැරණි වාර්තාවල (බයිබල් පදවල) දැක්වේ. **(ක්‍රියා 8:16 , 10:48 , 19:5** කියවන්න)

තවද නුඹලා වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ මොකක් කරතත් සියල්ලම ස්වාමී වූ යේසුස්වහන්සේගේ නාමයෙන් කරමින්, .......... **(කොලොස්සි 3:17)**

.......... මක් නිසාද අපගේ ගැලවීමට අවශ්‍ය වූ මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේ යයි කීවේය. **(ක්‍රියා 4:12)**

## තුන්වන පියවර ශුද්ධාත්මය ලබාගන්න.

## Step Three Receive The holy Ghost

ඔබගේ පැරණි පව්කාර ජීවිතය මියගොස් බෞතිස්මයේ දී ඔබ ක්‍රිස්තුස්වහන්සේ සමග ගුමදාන කරනු ලැබූ පසු ඔබ අළුත් ජීවිතයක් ඇරඹීම සඳහා උත්ථානය වීමට සූදානම්ය. ඔබ නැවත ඉපදිය යුතුය. යනුවෙන් යේසුස් වහන්සේ ප්‍රකාශ කල විට උන්වහන්සේ අදහස් කල අළුත් උත්පත්තිය මෙයයි.

අදහන්නා වූ අළුත් ජීවිතයක් ලබාදෙන දෙවියන් වහන්සේ ගේ ජීවන හුස්ම ලැබෙන්නේ ශුද්ධාත්ම බෞතිස්මයෙන් හෝ ශුද්ධාත්මය පිරීමෙන්ය. ශුද්ධාත්ම බෞතිස්මයේ බාහිර සාක්ෂිය වන්නේ ආත්මය දුන් ප්‍රකාරයට වෙනත් දිව්වලින් (අන් භාෂාවලින්) කථා කිරීමයි.

එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන් වහන්සේගේ මහිමය කරණකොට ගෙන මළවුන්ගෙන් නැගිටවනු ලැබුවාසේම අපිත් ජීවනය අළුත්කමෙන් හැසිරෙන පිණිස උන්වහන්සේගේ මරණයේ සමානාත්මතාවයෙන් අපි උන්වහන්සේට සම්බන්ධ වී සිටිමු, නම් උන්වහන්සේගේ නැගිටීමේ සමානාත්වයෙනුත් සම්බන්ධ වන්නෙමු. **(රෝම 6:4,5)** යේසුස් වහන්සේගේ නැවත පැමිණීමේදී උත්ථානයේ ජීවනය ලැබෙන්නේ ශුද්ධාත්මය කරණකොටගෙනය.

යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ තැන තැනත්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන සේක් නම්, ක්‍රිස්තුස් යේසුස් වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ තැනන්වහන්සේ නුඹලා තුලෙහි වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොට ගෙන නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත්කරන සේක. **(රෝම 8:11)**

මේ ජීවිතය ලැබිය හැක්කේ කාටද? ඔබට එය ලැබිය හැකිය: "පොරොන්දුව නුඹලාටත් නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමී වූ දෙවියන්වහන්සේගේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැදවන සේක්ද දුර සිටින්නා වූ ඒ සියල්ලන්ටත් යයි" **(ක්‍රියා 2:39)**

දෙවියන් වහන්සේගේ ජීවන මාර්ගයට එක්වීමට උන්වහන්සේ
අද ඔබට ආරාධනා කරණ සේක.

**God is Calling You Today to the Way of Life.**

**එක්සත් පෙන්ත කොස්ත සභාව.**
**නො. 1, ටෙම්ප්ලර් පෙදෙස, ගල්කිස්ස.**
**දුරකථන : 712615 , 716951**

Apostolische Pfingstgemeinde Mannheim
Friedelsheimerstr. 18-20
D - 68199 Mannheim (Neckarau) /Germany
Pastor Raymond Wey
Assistent Pastor Sascha Wey
www.jesus-is-god.de, www.v-p-m.de